# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 අගෝස්තු / සැප්තැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

**සමාජවිද්‍යාව (නව නිර්දේශය)**

**සමාජ විද්‍යාවේ මූලික සංකල්ප - SOCI 18214**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සමාජවිද්‍යාවේ සංවර්ධනය සඳහා ඔගස්ට් කොම්ට් සහ එමිල් ඩර්කයිම්ගේ දායකත්වය සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.

02. ''සමාජවිද්‍යාත්මක පරිකල්පනය හුරුපුරුදු අත්දැකීම් ඉවත දමා සමාජ යථාර්තය විවේචනාත්මකව පරීක්ෂා කිරීමට අප යොමු කරයි.'' මෙම ප්‍රකාශය සමාජවිද්‍යාත්මකව සාකච්ඡා කරන්න.

03. මැක්ස් වෙබර්ගේ පරමාදර්ශී නිලබලවාදී ආකෘතියේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වා එම ලක්ෂණ නිලබලවාදී සංවිධානයක කාර්යක්ෂමතාවයට දායක වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

04. සමාජානුයෝජනය පුද්ගල සහ සමාජ අනන්‍යතාවය හැඩගස්වන ආකාරය සහ සමාජ සහජීවනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

05. සමාජ සංචලතාව ප්‍රවර්ධනය කිරීමේ දී, සංස්කෘතික වටිනාකම් සම්ප්‍රේෂණය කිරීමේදී සහ වැඩිහිටි භූමිකාවන් සඳහා පුද්ගලයින් සූදානම් කිරීමේදී සමාජ සංස්ථාවක් ලෙස අධ්‍යාපනයේ කාර්යභාරය පරීක්ෂා කරන්න.

06. උදාහරණ සපයමින් සහ ඒවා පුද්ගල ජීවිත අවස්ථාවන්ට බලපාන ආකාරය පැහැදිලි කරමින් සාධිත තත්ත්වය සහ ආරෝපිත තත්ත්වය අතර වෙනස පැහැදිලි කරන්න.

07. සමාජ අසමානතාවය නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමේදී සමාජ පන්තිය, ජාතිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අතර සංකීර්ණ සම්බන්ධතාවය විශ්ලේෂණය කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

    අ. මැක්ස් වෙබර්

    ආ. ඥාතීත්වය

    ඇ. සමාජ සමූහ

    ඈ. හැරියට් මාර්ටිනි

*************************